# කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

## ටෙන්ඩර් අංකය : MIA/FIN/32/38/01 (II)

# භාවිතා කරන ලද වාහන විකිණීම සඳහා ලංසු කැඳවීම

**01. ලංසු කැඳවීම**

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් අමාත්‍යාංශයේ භාවිතයෙන් ඉවත් කර ඇති නමුත් තවදුරටත් පරිහරණය කළ හැකි තත්ත්වයේ පවතින භාවිතා කරන ලද වාහන හයක් (06) විකිණීම සඳහා විවෘත ලංසු කැඳවනු ලැබේ.

**02. වාහන පරීක්ෂා කිරීම**

විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති පහත සඳහන් වාහන 2026 ඔක්තෝබර් මස 19 වන දින සිට 2026 නොවැම්බර් මස 09 වන දින දක්වා කාර්යාලයීය දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා අමාත්‍යාංශ පරිශ්‍රයේදී පරීක්ෂා කළ හැකිය.

**වගු අංක 01 - භාවිතා කරන ලද පරිහරණය කළ හැකි තත්ත්වයේ පවතින වාහන**

| අනු අංකය | වාහන අංකය | වර්ගය / මාදිලිය | ඉන්ධන වර්ගය | නිෂ්පාදිත වර්ෂය | 2026 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම රු. | ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල රු. | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| 1 | 65 - 5XXX | Volvo - S 80 | ඩීසල් | 1999 | 2,000,000/- | 75,000/- | |
| 2 | KB-4XXX | Hyundai - Tucson | පෙට්‍රල් | 2006 | 3,800,000/- | 75,000/- | වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනු පිටපතක් පවතී. |
| 3 | KQ-1XXX | Volvo-S 80 | ඩීසල් | 2011 | 5,400,000/- | 75,000/- | |
| 4 | KO-1XXX | Audi - A6 2.0 LT | පෙට්‍රල් | 2011 | 6,100,000/- | 75,000/- | තීරු බදු 35,001/- බදු මුදලින්ද ගෙවීමට යටත්වේ |
| 5 | KY-3XXX | Lanad Rover - Discovery | ඩීසල් | 2014 | 19,500,000/- | 100,000/- | රු. 850,332/- ක තීරු බදු මුදලක්ද ගෙවීමට යටත්වේ. |
| 6 | CAU-2XXX | BMW-740 LE | පෙට්‍රල් / විදුලි | 2017 | 25,500,000/- | 100,000/- | |

**සටහන**

i. ඉහත වගුවෙහි "2026 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම" යනුවෙන් සඳහන් තීරුව මගින් එක් එක් වාහනය සඳහා තක්සේරු කමිටුවක් විසින් තීරණය කරනු ලැබූ තක්සේරු වටිනාකම දක්වා ඇත. අදාළ තක්සේරු වටිනාකම ඉක්මවන ලංසු ඉදිරිපත් කර ඇති ලංසුකරුවන් අතරින් වැඩි ම ලංසුව ඉදිරිපත් කරන ලංසුකරු වෙත අදාළ වාහනය විකිණීමට කටයුතු කරනු ලැබේ.

ii. ඉහත වගු අංක 01 හි අනු අංක 4 සහ 5 යටතේ සඳහන් වාහන තීරුබදු සහන යටතේ ආනයනය කර ඇති බැවින්, එම වාහන සඳහා සාර්ථක ලංසුකරු විසින් පිළිගත් ලංසු මුදල අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවිය යුතුය. ඉන් අනතුරුව, ඉහත වගුවේ අදාළ වාහනයට ඉදිරියෙන් තීරුවෙහි සඳහන් "වෙනත් කරුණු" තීරුබදු මුදල ශ්‍රී ලංකා රේගුව වෙත ගෙවිය යුතුය. තීරුබදු මුදල ගෙවීමෙන් පසු ඒ සඳහා නිකුත් කරනු ලබන රිසිට්පත හෝ අදාළ ගෙවීම තහවුරු කරන ලේඛනය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අදාළ වාහනයේ අයිතිය පැවරීමේ කටයුතු සිදු කරගත හැකිය.

**03. ලංසු ලේඛන ලබා ගැනීම**

2026 ඔක්තෝබර් මස 19 වන දින සිට 2026 නොවැම්බර් මස 09 වන දින දක්වා කාර්යාලයීය දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ රු. 5,000/- ක ආපසු නොගෙවනු ලබන ගාස්තුවක් අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවිය යුතුය. එම ගෙවීම සඳහා නිකුත් කරනු ලබන ලදුපත අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලංසු ලේඛන ලබා ගත හැකිය.

**04. ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල**

ලංසු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන සෑම වාහනයක් සඳහාම වගු අංක 01 හි සඳහන් පරිදි වෙන වෙනම ආපසු ගෙවනු ලබන තැන්පතු මුදලක් ගෙවිය යුතුය. එම තැන්පතු මුදල ගෙවීම තහවුරු කරන ලදුපතෙහි පිටපතක් (පොදු 172) ලේඛන සමග ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. මෙම අවශ්‍යතාව සපුරාලීමට අපොහොසත් වන ලංසු සලකා බැලීම සඳහා සුදුසුකමක් නොලබයි.

**05. ලංසු භාරදීම සහ විවෘත කිරීම**

නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසු 2026 නොවැම්බර් මස 10 වන දින ප.ව. 02.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, අංක 73/1, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයට යොමු කිරීම හෝ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ලංසු 2026 නොවැම්බර් මස 10 වන දින ප.ව. 02.00 ට අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට අදාළ ලංසුකරුට හෝ ඔහු විසින් බලය පවරනු ලබන එක් නියෝජිතයෙකුට සහභාගී විය හැකිය.

**06. ප්‍රවාහන වියදම් සහ තීරුබදු ගෙවීම**

මිලදී ගනු ලබන වාහන අමාත්‍යාංශ පරිශ්‍රයෙන් ඉවත් කර ප්‍රවාහනය කිරීම සඳහා වැය වන සියලුම වියදම් අදාළ වාහනය මිලදී ගනු ලබන පාර්ශ්වය විසින් දැරිය යුතුය. තීරුබදු සහන යටතේ ආනයනය කර ඇති වාහන මිලදී ගැනීමේදී, සාර්ථක ලංසුකරු විසින් පිළිගත් ලංසු මුදල සහ අදාළ තීරුබදු මුදල වෙන වෙනම ගෙවා, වාහනය මිලදී ගැනීම සහ එහි අයිතිය තම නමට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පූර්ණ කළ යුතුය.

**07. අයිතිය පැවරීම සහ වගකීම් භාර කිරීම**

ඉහත සඳහන් වාහන විකිණීමෙන් අනතුරුව, ඒවායේ අයිතිය පැවරීම සඳහා අවශ්‍ය ලේඛන කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කර දෙනු ලැබේ. අයිතිය පැවරීමෙන් අනතුරුව, එලෙස විකිණීමෙන් ඉවත් කරනු ලබන වාහන සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් තවදුරටත් කිසිදු වගකීමක් භාරගනු නොලැබේ.

**08. වැඩිදුර තොරතුරු**

**මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු පහත දුරකථන අංක ඔස්සේ ලබාගත හැකිය.**

- ප්‍රවාහන අංශය : 011-2392149 / දිගුව 241
- ප්‍රසම්පාදන අංශය : 011-2347392 / දිගුව 266

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය,**
**අංක 73/1, ගාලු පාර, කොළඹ 03.**